1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எமது இல.<br>My Ref. | CSS/2/4/Common-I | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026.09.04 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (පාලන/පිරිස් හා පුහුණු),
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දකුණු පළාත.

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I,II හා III නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2027**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2026.09.01 දිනැති ව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2026 හා බැඳේ.

02. ඒ අනුව, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I, II හා III ශ්‍රේණියේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2027 අනුව සියලු සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I, II හා III ශ්‍රේණියේ වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් සියලුම නිලධාරීන්ට අයත් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් **2026.10.07** දිනට ප්‍රථම මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණික ව ඉල්ලා සිටිමි.

03. එමෙන්ම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2026 හි 15.1 වගන්ති ප්‍රකාරව ඇමුණුම II හා ඇමුණුම III ආකෘතීන් නිවැරදිව සම්පූර්ණ කර දත්ත පැතුරුම්පත් (MS Excel) භාවිතයෙන් සකස් කර **2026.10.07** දිනට පෙර spcsrecruitment@gmail.com විද්‍යුත් තැපැල වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් ඉල්ලා සිටිමි. තවද, එහි දෘඩ පිටපත් ද කඩිනමින් මා වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

04. අදාළ ආකෘති පත්‍රවල මෘදු පිටපත් පහත දැක්වෙන පරිදි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ www.pubad.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

05. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

**චන්දිම සී මුහන්දිරම්ගේ,**
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary 091 2222603

කාර්යාලය
அலுவலகம்
Office 091 4119011
091 2234052

091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk

එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
S.H. Dahanayaka Mawatha, Galle.
எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"ඩිජිටල් නවෝත්පාදනයෙන් ගුණාත්මක රාජ්‍ය සේවයක්"